fmd.sia udOH fldÜGdih

பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk

මගේ අංකය
எனது இலக்கம்
My NO — 1390 / 2023

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2023 திகதி

දිනය
Date — 06/11/2023
පැය 0940

# මාධ්‍ය නිවේදනය

## 01. නීති විරෝධී ලෙස පවත්වාගෙන ගිය මත්පැන් නිෂ්පාදනාගාරයක් වැටලීම- දොම්පේ පොලිස් ස්ථානය.

2023.11.05 වන දින සවස් කාලයේ දොම්පේ පොලිස් වසමේ කලුකොඳයාව, මල්වාන ප්‍රදේශයේ ගොඩනැඟිල්ලක නීති විරෝධීව අරක්කු නිෂ්පාදනය කර බෝතල් වලට ඇසිරීම සිදුකරන බවට දොම්පේ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **එතනෝල් සාන්ද්‍රණය යොදාගනිමින්** නීති විරෝධීව අරක්කු නිෂ්පාදනය කරන ස්ථානයක් වටලා නීති විරෝධීව නිෂ්පාදනය කරන ලද මත්පැන් බෝතල් විශාල ප්‍රමාණයක් සමඟ සැකකරුවන් 12 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

දොම්පේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පිටකොටුව පොලිස් ස්ථානය.

2023.11.06 වන දින අළුයම් කාලයේ පිටකොටුව පොලිස් වසමේ මධ්‍යම බස් නැවතුම්පල අසලදී පිටකොටුව පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 65 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 30 ක් වන වේරවත්ත, පානදුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පිටකොටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පුලියන්කුලම පොලිස් ස්ථානය.

2023.11.05 වන දින රාත්‍රී කාලයේ පුලියන්කුලම පොලිස් වසමේ සින්නපුවරසන්කුලම් හන්දිය ප්‍රදේශයේදී පුලියන්කුලම පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත බෙහෙත්**

**කොටන තුවක්කුවක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 57 ක් වන පුලියන්කුලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පුලියන්කුලම පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - බණ්ඩාරගම පොලිස් වසම.

2023.11.05 වන දින අළුයම් කාලයේ බණ්ඩාරගම පොලිස් වසමේ බණ්ඩාරගම හොරණ මාර්ගයේ කොතලාවල ප්‍රදේශයේදී හඳුනා නොගත් වාහනයක පුද්ගලයෙකු ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පදික පුද්ගලයා හොරණ රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත. අනතුර සිදුකළ වාහනය පලාගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 36 ක් වන අඟුරුවාතොට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය හොරණ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සිදුකල සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා බණ්ඩාරගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**